**ශීර්ෂය - 221 කම්කරු දෙපාර්තමේන්තුව**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කම්කරු දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කම්කරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම**,** විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1** **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අත්තිකාරම් ගිණුමේ ශේෂය, අවසාන භාණ්ඩාගාර ප්‍රකාශයට වඩා රු.164,793 ක් වැඩියෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබු අතර එම නිසා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ අත්තිකාරම් ගිණුම් ශේෂය හා ශුද්ධ වත්කම්වල අගය රු.164,793 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබූ වත්කම් මිලදී ගැනීම් මගින් අත්පත් කරගත් වටිනාකම රු.943,495,888 ක් වූ නමුත් වැඩසටහන් වියදම් ප්‍රකාශයේ එම වටිනාකම රු.943,520,888 ක් වූ හෙයින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.25,000 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි | රජ්‍ය ගිණුම් චක්‍රලේඛ මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ශේෂ පිරික්සුම අනුව, 2020 වර්ෂය තුල වැය විෂයයන් 3 ක නොනිමි වැඩ වියදම් රු.940,730,168 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ නොනිමි වැඩ ලෙස දක්වා තිබූ ශේෂය රු.931,870,210 ක් වුයෙන් නොනිමි වැඩවල වටිනාකම රු.8,859,958 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි | එම |
| (ඈ) | ශේෂ පිරික්සුම අනුව වැය විෂයයන් 2 ක් යටතේ යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ අත්පත් කර ගැනීම්වල වටිනාකම රු.1,296,347 ක් වුවද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එම වියදම රු.9,936,879 ක් ලෙස රු. 8,640,532 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | එම.. |

1.6.2 **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා, භාණ්ඩාගාර අවසාන ප්‍රකාශ සැසඳීමේදී, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් රු.857,773ක් අඩුවෙන්ද, අත්තිකාරම් ගෙවීම් රු. 693,030 ක් අඩුවෙන්ද දක්වා තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | රජය ගිණුම් චක්‍රලේඛ මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් හා නොනිම් වැඩ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම.. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**1.6.3.1 ආදායම් නොවන ලැබීම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ආදායම් නොවන ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම අනුව ආදායම් නොවන ලැබීම්වල එකතුව රු.845,791,843 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව එය රු.854,602,392 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආදායම් නොවන ලැබීම් රු.8,810,549 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. ඉකුත් වර්ෂය අවසානයේදී, මැතිවරණ කොමසාරිස් කාර්යාලයෙන් ලැබී තිබූ එම මුදල, පොදු තැන්පත් ගිණුම මගින් නිරවුල්කර තිබියදී, නැවත වෙනත් ආදායම් ලැබීම් යටතේ දැක්වීම මේ සඳහා හේතු වී තිබුණි. | මැතිවරණ කොමසාරිස් කාර්යාලයෙන් ලද රු.8,810,549 ක මුදල ආදායම් නොවන ලැබීම් යටතේ දක්වා තිබීමෙන් මෙම වරද සිදු වී ඇත. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී විධිමත් අධීක්ෂණයක් කළ යුතු වීම |

### 1.6.4 අත්තිකාරම් ගිණුම් ශේෂ

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අක්මුදල් ගැලපුම් ගිණුමේ අත්තිකාරම් **'බී'** ගිණුමෙහි වෙනස රු.11,592,029 ක් ලෙස දක්වා තිබුණද**,** ශේෂ ගැලපුම් කල පසු එම වෙනස රු.11,448,604 ක් වීම නිසා රු.143,425 ක් වැඩියෙන් ගැලපුම් ගිණුමේ දක්වා තිබුණි. | පෙන්වා දී ඇති පරිදි මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සිදු වී ඇති දෝෂයන් හේතුවෙන් අක්මුදල් ගැලපුම් ගිණුම පිළියෙල කිරීමේ දී මෙම වරද සිදු වී ඇත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

**පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරුණි**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්ථන වැය විෂයයන් 20 **ක් සඳහා වෙන් කරන ලද** රු.43,200,000 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් ඉතිරිවූ ප්‍රමාණය රු.16,274,745 ක් එනම් සියයට 37.6 ක් වූ අතර එය එක් එක් වැය විෂයයන්ගේ ප්‍රතිපාදනයෙන් සියයට 22 සිට සියයට 100 දක්වා පරාසයක විය.<br>ප්‍රාග්ධන වැය විෂයයන් 05 කට අදාලව රු.12,050,000 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් ඉතිරි ප්‍රමාණය රු.3,940,647 ක් වූ අතර එය එක් එක් වැය විෂයයන් සඳහා වූ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 25 සිට සියයට 67 දක්වා පරාසයක විය. | කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා වසර පුරා වරින් වර කාර්යාල වසා තැබීම නිසා අපේක්ෂිත ලෙස ප්‍රතිපාදන වැය කිරීමට නොහැකි විය. | මු.රෙ.50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කික පදනමකින් හා නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂය අංක 221-2-4-1-1404 සඳහා ශුද්ධ ප්‍රතිපාදනය රු.65,300,000 න් ඉතිරිය සියයට 51 ක් හෙවත් රු.33,269,461 ක් වී තිබුණි. | පසුගිය වර්ෂයේදී සේවක අර්ථසාධක අරමුදල් අංශයේ ඇතැම් අංශ මෙහෙවර පියෙස ගොඩනැගිල්ලට මාරු නොවීම නිසා බඳුකුලී ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු විය. | මු.රෙ.50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් තාර්කික පදනමකින් හා නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කලයුතු වීම. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

බැරකම් හා බැදීම්වලට අදාළව අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත පරිදි වේ.

| | විගණන නිරීක්ෂණය<br>--------------------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------------------- | නිර්දේශය<br>------------------ |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර ප්‍රකාශය අනුව රු.83,004,986 ක් වූ බැරකම් ගිණුම් ප්‍රකාශවල සටහන් කර නොතිබුණි. | අප දෙපාර්තමේන්තුවේ කලාප, දිස්ත්‍රික්, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු යන උප කාර්යාල හා අනෙකුත් අංශවලින් බැරකම් ලෙස හඳුනාගෙන අප වෙත වාර්තා කරන ලද ඇතැම් බැරකම් ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙවැනි වෙනස්කම් ඇති විය.. | දෙපාර්තමේන්තුව විසින් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම පියවීමට ඇති නිවැරදි බැරකම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කලයුතු වීම. |
| (ආ) | රු.2,969,199 ක් වටිනා බැරකම් ගිණුම් ප්‍රකාශවල සටහන් වී තිබුණද භාණ්ඩාගාරයේ සටහන් වී නොතිබුණි. | අප දෙපාර්තමේන්තුව කලාප, දිස්ත්‍රික්, උප කාර්යාල, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුයන කාර්යාල හා අනෙකුත් අංශ ලෙස අංශ 96 කින් සමන්විත වේ. මෙම අංශ 96 තුළ ප්‍රතිපාදන පාලනයේ දී ප්‍රායෝගික අපහසුතා රාශියක් පැන නගී. මෙහි දී භාණ්ඩාගාරය වෙත තොරතුරු ඉදිරිපත් කරන දින වන විට හඳුනා නොගත් බැරකම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන දින වන විට වාර්තා වීම නිසා මෙම වෙනස දක්නට ලැබේ. | එම |
| (ඇ) | ගිණුම් ප්‍රකාශයේ සඳහන් වැය විෂය අංක 2 ක් යටතේ දක්වා තිබූ රු.61,954 ක බැරකම්, බැරකම් ලේඛණයේ සටහන් කර නොතිබුණි. | බැරකම් ලේඛනයට තොරතුරු ඇතුළත් කිරීමේ දී සිදු වූ ප්‍රමාද දෝශයක් මත මෙම වරද සිදු වී ඇත. | එම |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ව්‍යාපෘති අංක 04 යටතේ සඳහන් වැය විෂයන් 6 ක ට අදාල බැරකම් රු.2,368,236 ක් වෙනුවෙන් 2021 වර්ෂයේදී රු.643,485 ක් වැඩියෙන් ගෙවා තිබුණි. තවද, වැය විෂයයන් 3 ක් යටතේ දැක්විය යුතු රු.6,637,421 ක බැරකම් ගිණුම් ප්‍රකාශවල දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනෙකුත් බැරකම් ගෙවීම් කිරීම සඳහා ඉදිරිපත් නොවීම ඊට හේතු විය.සේවක අර්ථසාධක අරමුදල් ගිණුම උපචිත පදනම මත පිළියෙල කිරීමේදී මෙම වටිනාකම මුදලින් ගෙවීම් කර නොමැති අතර එය මුදල් පදනම මත පිළියෙල කරනු ලබන දෙපාර්තමේන්තු ගිණුමේ ගෙවිය යුතු වියදමක් වේ. | එම |
| (ඉ) | 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 හි 05 වගන්තියට අනුව 2013 වර්ෂයේදී මෙහෙවර පියෙස ගොඩනැගිල් ඉදිකිරීම 2021 වර්ෂය වන විටත් අවසන්ව නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින වන විට ඉතිරිව තිබූ බැඳීම් ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. අංක 221-1-1-2104 දරන වැය විෂය යටතේ රු.704,900,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද ඉන් රු.66,598,182 ක් ඉතිරිව තිබූ අතර අවසාන බිල්පත ගෙවීමට තිබෙන වටිනාකම අදාළ බැරකම්, බැරකම් ප්‍රකාශයේ සටහනක් මගින් හෝ සඳහන් කර නොතිබුණි. | අවසාන බිල්පත ඉදිරිපත් නොවීම හේතුවෙන් ගෙවිය යුතු නියමිත වටිනාකම තහවුරු කරගැනීමට නොහැකි වීම නිසා බැරකම්, බැඳීම් ප්‍රකාශයට ඇතුලත් කර නොමැත. | එම |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත පරිදි වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී සැසඳුම් ප්‍රකාශයේ සඳහන් අක්‍රීය ණය ශේෂවල වටිනාකම රු.1,296,825 ක් වූ අතර එම ණය ශේෂ වසර 04 කට අධික කාලයක සිට අයකිරීම් සිදුකර නොතිබුණි. | ස්ථාන මාරුවී ගිය නිලධාරීන් ණය ශේෂය සම්බන්ධයෙන් රාජය මුදල් චක්‍රලේඛ 01/2020 මු.රෙ.133 (6) (ඇ) පරිදි කටයුතු කරන අතර, විශ්‍රාම ගිය නිලධාරීන්ගේ විශ්‍රාම පාරිතෝෂිකය මේ වන විට සකස් කරමින් පවතී.වැඩ තහනම් කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් නඩු කටයුතු තවදුරටත් සිදුවෙමින් පවතින අතර, ණය ශේෂ වාරික වශයෙන් | අප්‍රමාදව හිඟ ශේෂ අයකර ගැනීමටත් නිවැරදිව ණය ලේඛණ පවත්වාගෙන යාමටත් කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | හෝ අයකර ගැනීමට ලිපි මගින් දන්වා ඇතත් මේ වන තෙක් එම වාරික ගෙවීමට කටයුතු කර නොමැත. | |
| (ආ) | සේවය අතහැර ගොස් තිබූ, සේවයෙන් පහකල හා සේවය අවසන් කල නිලධාරීන්ගෙන් වර්ෂ 2 ත් 5 ත් කාලයක සිට අයවීමට තිබූ වූ රු.2,114,219 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානයටත් අයකරගෙන නොතිබුණි. | වර්ෂ 02 ට වැඩි ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරනු ලබන අතර, රු.25,000 ක් නොඉක්මවන ණය ශේෂ සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හා මු.රෙ.113 (6) පරිදි කටයුතු කරමින් පවතී. නිලධාරීන් තුන්දෙනෙකුගේ ණය ශේෂ ඇපකරුවන්ගෙන් අයවෙමින් පවති. | එම |

## 2.4 තැන්පත් ශේෂයන්

තැන්පත් ශේෂයන් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත පරිදි වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට ගිණුම් ප්‍රකාශ අනුව පොදු තැන්පත් ගිණුම් 02 හි ශේෂය රු.862,823,135 ක් වූ අතර එයින් අවු: 2 ට වැඩි රු.405,374,480 ක ශේෂයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 (2) හා (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වසර දෙක ඉක්මවූ තැන්පතු පිළිබඳව මු.රෙ. 571 අනුව සිදුකිරීමට හැකි සෑම අවස්ථාවකම කටයුතු කර ඇති අතර. අදාල දිස්ත්‍රික් කාර්යාලයන් විසින් ගෙවීම් ප්‍රමාදවන තැන්පතු රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. | පොදු තැන්පතු ගිණුමේ පවත්නා ශේෂ හඳුනාගෙන පුද්ගලික ගිණුම්වලට අප්‍රමාදව බැරකිරීමට කටයුතු කලයුතු වීම. |

## 2.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>------------------------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------ | නිර්දේශය<br>---------------------- |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් 31 දක්වා ඉදිකිරීම් කාර්යයන් 08 ක් වෙනුවෙන් කාර්යයන් ආරම්භයේදීම මුළු ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.120,239,994 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණි. | විශාල කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කිරීමේදී ප්‍රසම්පාදන කමිටු තීරණයේ සඳහන් පරිදි මුදල් නිදහස් කිරීමක් සිදුකරනු ලබයි. දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් නොකිරීම නිසා හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉල්ලීම අනුව මුදල් නිදහස් කිරීම මේ දක්වා සිදුකර ඇත. මේ වසරේ සිට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන නිදහස් කිරීම පමණක් සිදුකල අතර ඉදිරියේදී වෙක්පත් ලබාදීමක් සිදුනොකරන අතර ප්‍රතිපාදන නිදහස් කිරීම පමණක් සිදුකිරීම කරනු ලබයි. | ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ගෙවීම් කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, ICTAD කොන්දේසි හා මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් කිරීම කළමණාකාරීත්වයේ වගකීම වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වර්ෂ 2013 සිට 2020 කාලපරිච්ඡේදය තුලදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත කම්කරු දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් හා වැඩිදියුනු කිරීමේ කාර්යයන් 25 ක් සඳහා රු.320,106,499 ක් ගෙවීම් කර තිබූ අතර 2021 මාර්තු 31 දින වන විට එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 90 ත් සියයට 100 ත් අතර විය. ලබාදී තිබූ මුදල්වලින් රු.41,519,249 ක් එනම් සියයට 13 ක් ඉතිරිව පැවතුණි.එම ඉතිරි මුදල් නැවත ලබාගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි | ඉතුරු මුදල් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග විමසා නැවත ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යැවීමට කටයුතු කරනු ලැබේ. මුදල් අංශය සතුව පවතින තොරතුරුවල නිවරදාතාවය පරීක්ෂා කර වැඩිදුර තොරතුරු ලබාගැනීම සඳහා පාලන අංශය හා ගොඩනැගිලි නඩත්තු අංශයේ ඉංජිනේරු වෙත ඉදිරිපත් කර ඇත. | අදාල ගෙවීම් කිරීමේදී මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව ගෙවීමටත් ඒ සම්බන්ධයෙන් නිසි වාර්තා, පොත්පත්, පවත්වාගෙන යාමත්, ප්‍රගතිය සමාලෝචනය කිරීමත් අදාල නිලධාරියාගේ වගකීම වේ. |
| (ඇ) | සියෙරා ජොයින්ට් වෙන්චර් සමඟ 2013 ඔක්තෝම්බර් 03 එළඹ තිබූ ගිවිසුමට අනුව මාස 36 කින් මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට එකඟ වී තිබූ නමුත් 2019 ජුනි 26 දින අංක අමප/19/1638/101/046-1 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට යටත්ව 2019 ජුනි 30 දක්වා කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර තිබුණි. කෙසේ වුවද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන්ව නොතිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ අතර රු.මිලියන 7,891 ක් වූ මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 39.3 ක් එනම් රු. මිලියන 3,099 ක් මුල් අනුමත ඇස්තමේන්තුවෙන් අත්හල වැඩ (Omissions) ලෙසත් සියයට 39.6 ක් එකතු කල අතිරේක වැඩ (Additions) ලෙසත් 46 වන ගෙවීම් සහතිකයට (payment certificate) ඇතුලත් කර තිබුණි. මෙම අයිතමයන් හඳුනාගැනීමට අවශ්‍ය සැසඳීම් වාර්තා (comparission sheet) විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, අන්තර් ගෙවීම් සහතික (IPC) 13 ක් වෙනුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස | ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් තහවුරුවක් ලබා ගැනීමෙන් පසු පිලිතුරු සපයන බව දන්වා ඇත. | ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුය. ගොඩනැගිලි ඇස්තමේන්තු සකස් කිරීමේදී නිවැරදිව සැලසුම්කර විධිමත් පරිදි සකස් කිරීමට කටයුතු කල යුතු අතර තවද, නියමිත දිනට පෙර අන්තර් ගෙවීම් සිදු කිරීමට කටයුතු කල යුතුවීම. |

රු.21,772,797 ක මුදලක් (VAT බදු ඇතුලත්ව) 2020 දෙසැම්බර් 31 දින සියෙරා ජොයින්ට් වෙන්චර් (Sierra joint venture) වෙත ගෙවා තිබුණි.

## 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- | --- |
| (අ) | 2020 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමාලෝචනය කර නොතිබූ අතර වර්ෂය තුලදී ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් නොවූ කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් රු.20,618,992 ක මුදලක් වැය කර තිබුණි. | 2020 වර්ෂයේදී කොරෝනා වසංගතය හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මෙයට හේතුවිය. ප්‍රසම්පාදන සැලැස්මට පරිබාහිරව සිදුකරන ලද කාර්යයන් අදාල දිස්ත්‍රික් කාර්යාලවලින් ඉල්ලීම් කරන ලද අත්‍යවශ්‍ය කාර්යයන් වූ බැවින් එම නඩත්තු කාර්යයන් සිදු කරන ලදී | වර්ෂය තුලදී අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කලයුතු අතර ප්‍රගතිය සමාලෝචනය කිරීම කළමණාකාරීත්වයේ වගකීමක් වීම. |
| (ආ) | මෙහෙවෙර පියෙස ගොඩනැගිල්ලේ 12 වන මහලේ සිට 16 වන මහල දක්වා බෙදුම් ඇඳි සවිකිරීම සඳහා වූ රු.135,300,000 ක් වූ පිරිවැය ඇස්තමේන්තුව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමත කර නොතිබූ අතර තාක්ෂණික කමිටු නිර්දේශ ලබාගැනීමකින් තොරව ප්‍රසම්පාදන කමිටුව විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මෙම කාර්යය ඉටු කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(i) ජේදයට පටහැනිව මුළු ඇස්තමේන්තුගත පිරිවැය වූ රු.135,300,000 සම්පූර්ණයෙන්ම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කර තිබූ අතර 2021 මාර්තු මාසය වන විටත් කොන්ත්‍රාත්තුව යටතේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | නිශ්චිත පිළිතුරක් ලබාදී නොතිබුණි | ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ගෙවීම් කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, ICTAD කොන්දේසි හා මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් කිරීම කළමණාකාරීත්වයේ වගකීම වේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------------------- | ---------------------------------- | ---------------------- |
| (අ) | කම්කරු දෙපාර්තමේන්තුව සතු කම්කරු කාර්යාල පැවති ගොඩනැගිලි 03 ක් එම කාර්යාල නව ගොඩනැගිලිවලට ගෙන යාම නිසා වසර 01 සිට වසර 09 දක්වා කාල පරාසයක සිට නිශ්කාර්යව පැවතුණි.<br>කම්කරු දෙපාර්තමේන්තුව සතු දිස්ත්‍රික් කාර්යාල 4 ක හා කුරුණෑගල දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂණ ඉංජිනේරු කාර්යාලයේ ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කිරීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් කටයුතු කර නොතිබුණි. | හම්බන්තොට පැරණි කම්කරු කාර්යාල ගොඩනැගිල්ල සංචාරක බංගලාවක් බවට පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.<br>අවිස්සාවේල්ල කම්කරු කාර්යාල ගොඩනැගිල්ලෙහි රත්නපුර දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය ස්ථාපිත කර ඇත.<br>කිලිනොච්චි පැරණි කම්කරු කාර්යාල ගොඩනැගිල්ල ගබඩා කටයුතු සඳහා භාවිතා කරණු ලැබේ.<br>කම්කරු දෙපාර්තමේන්තුවට අයත් කම්කරු කාර්යාලවල වටිනාකම් තක්සේරු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | රජයේ ගොඩනැගිලි උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව භාවිතා කිරීමට කටයුතු කල යුතුය. තක්සේරු නොකල ගොඩනැගිලි පිළිගත් තක්සේරුකරුවන් ලවා තක්සේරු කිරීමට කටයුතු කල යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------------------- | ---------------------------------------- | ------------------------ |
| 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 3138 ක් වුවත් තථ්‍ය සේවක සංඛ්‍යාව 2570 ක් වූයෙන් පුරප්පාඩු 568 ක් වූ අතර කම්කරු කොමාසාරිස් ජනරාල්වරයාගේ පිළිතුර අනුව, 2021.04.30 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව 2,651 ක් බවද එදිනට පුරප්පාඩු සංඛ්‍යාව 487 ක් බවද දක්වා තිබුණි. | 2021 අප්‍රේල් 30 දිනට පවතින පුරප්පාඩු පිරවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. | දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත කාර්යයභාරය වඩාත් කාර්යක්ෂමව ක්‍රියාවේ යෙදවීමට හැකි ලෙස මානව සම්පත ප්‍රශස්ථ හා කාර්යක්ෂමව පවත්වාගෙන යාමට දෙපාර්තමේන්තුව කටයුතු කල යුතු වීම. |